# 16

# අද බැරි නම් හෙට තෝරාපන් යාළු

සිංහල ජනශ්‍රැති අංගයක් වන තේරවිලි කවි, ජනකවි විශේෂයකි. විවිධ ඉඟි ඔස්සේ අනුමානයෙන් අරුත් සපයන තේරවිලි කවි චින්තන ශක්තිය පුබුදු කිරීම සඳහා අපූරු අභ්‍යාසයක් ලෙස හැඳින්විය හැකි ය. භාෂා ඥානය ද අර්ථකථන හැකියාව ද දියුණු කරන මෙය, බුද්ධි පරීක්ෂණ විධික්‍රමයක් ලෙස ද සැලකිය හැකි ය. එමෙන් ම තේරවිලි කදිම විනෝදාංශයකි. සුහදතාව වර්ධනයට ඉවහල් වන තේරවිලි ගැමියාගේ කවිකම ද ප්‍රකට කරයි. තේරවිලි කවිවල දී බොහෝ විට පිළිතුර අපේක්ෂා කෙරුණේ ද කවියකිනි. තේරවිලිවලට නිවැරදිව පිළිතුරු දීම පාණ්ඩිත්‍යය ප්‍රකට කරන කරුණක් කොට සැලකුණ බව පෙනේ.

එක දිගට තාලයකට ගද්‍යයෙන් කියාගෙන ගොස් පද්‍යයෙන් අවසාන කරන ගද්‍ය පද්‍ය මිශ්‍රණය ටීකා සීපද නමින් හඳුන්වයි. උදාසීන බව, නිදිබර ගතිය දුරු කර ජීවනෝපාය කටයුතුවල සාර්ථකත්වයට අවශ්‍ය කායික මානසික සැහැල්ලුව ලැබීමට ගැමියා මෙබඳු මාධ්‍යවලින් සහාය ලබා ගත් බව පෙනේ. භාෂා කුසලතා දියුණුවට මෙම ටීකා සීපද උපයෝගි කර ගැනීමට හැකි ය.

තේරවිලි කවි සහ ටීකා සීපද කිහිපයක් ඇතුළත් මේ පාඩම තේරවිලිවලට සහ ටීකා සීපදවලට සවන් දී රස විඳීමේ ක්‍රියාකාරකම්වල නියැලීමට ඔබට මග පාදයි.






නොමිලේ බෙදා හැරීම සඳහා ය.

# තේරවිලි කවි

| | | |
|---|---|---|
| 1. | කොණ්ඩේ නැතිව නිතර ම තෙල් ගගා | යති |
| | කන්නේ නැතිව සැමගෙන් වියදම් | ගනිති |
| | නො දුටු  කෙනෙක් දුටුව ම සිත කැමති | වෙති |
| | මෙතුන් පදේ තේරුවොතින් නුවණ | ඇති |
| 2. | කොයි පැත්තෙන් බැලුවත් ඇස | පේන්නේ |
| | කොයිකා අසු වුණත් දෙකටයි | කැඩෙන්නේ |
| | අත් දෙක නැති වුණත් පා දෙක | තියෙන්නේ |
| | මූ නැති වුණොත් මේ මඟුලත් | කැඩෙන්නේ |
| 3. | ගමක නමකි අට අකුරෙන් | යෙදෙන්නේ |
| | මෙලක තැනකි පද තුනකින් | හැදෙන්නේ |
| | මුලට රජෙකි අග නිවසකි | සඟුන්නේ |
| | කිමෙක මෙසකි කිව හැකි දැයි | බලන්නේ |
| 4. | වනේ  උපන්නේ උණ ම යි | කියන්නේ |
| | වනේ ඉපදිලා දස අත | වැනෙන්නේ |
| | ජලේ වතුර බී නිතර ම | සිටින්නේ |
| | ගලේ ඔළුව ගහ නිතර ම | අඬන්නේ |
| 5. | එරන් කුඹේ පිට ඉන්න යි | කියා ගෙන |
| | උනා නිල්වරල පිට දිග | හෙළාගෙන |
| | කිරි ඇති දෙතන සළු සතකින් | වසාගෙන |
| | තෝරාපන් යාළු නුවණින් | බලාගෙන |
| 6. | අන්න  බලාපන් අත්තක | ඉඳලෝලු |
| | පපුව පළා ගෙන අඟනක් | මද කාලු |
| | කකා ගිය ලෙල්ල රස කර | උයාලු |
| | අද බැරි නම් හෙට තෝරාපන් | යාළු |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

7. කටුවානෙන් කෙටුවා වැනි කොළේ සැටි
රතු නූලෙන් ගෙතුවා වැනි මලේ සැටි
තුන් මස පිරෙන විට කුකුළෙකු විතර ඇති
සාරමසට පැසෙනා ගෙඩි කියන් සකි

8. අත්ත අගින් සූවිසි මල පිපෙන්නේ
නැට්ට ළගින් කිරි වැදිලා පැසෙන්නේ
ඇටත් පොතුත් නැති ගෙඩියකි බොලන්නේ
තෝරාපන් යාළු නුවණින් කියන්නේ

9. පොත්ත උඩින් සුදුපාටට දිලෙන්නේ
ඇන්න විට දි සරබර හඬ නගන්නේ
ඒ ඇතුළේ පිරිපුන් සඳ දිලෙන්නේ
නැට්ට නැති ගෙඩිය තෝරා එවන්නේ

## ටීකා සීපද

බැද්දේ ගියා වැලක් සොයා ගන්ට කියා ඉද්දවැල් තිබෙන්නා පෝටවැල් තිබෙන්නා නොයෙක් වැල් තිබෙන්නා එයින් එකක් ගෙනැල්ලා වෙළුවා සේ ම

වෙළි වෙළි වෙළී ඉස සිට දෙපතුලට වෙළී

කන්දේ ගියා මලක් සොයා ගන්ට කියා නාමල් තිබෙන්නා සපුමල් තිබෙන්නා පිච්ච මල් තිබෙන්නා එයින් එකක් ගෙනැල්ලා පැලැන්දා සේ ම

මලි මලි මලී නුඹෙ කොණ්ඩේ තිබෙන මලී

වතුරේ ගියා රළක් බලා ගන්ට කියා මුහුදු රළ තිබෙන්නා ගංගා රළ තිබෙන්නා වැව් රළ තිබෙන්නා එයින් එකක් රිස්සෙන් බැලුවා සේ ම

රළි රළි රළී නුඹෙ නරුපට තිබෙන රළී

වෙන රටේ ගෑනු කොල්ලෝ හතර පස් දෙනා නාවා කවා පොවා ගෙන ඉන්නවා මේ නැම්බිට අතකොළුවක් විතර නැති කොලුවා බලා ගැනීමට බෑ කියන්නා සේ ම

ලොලි ලොලි ලොලී බාලොලි ලොලි බාලලොලී

කජු වාරයක් ද කොස් වාරයක් ද දෙල් වාරයක් ද අඹ රඹුටන් වාරයක් ද මොන හත්වලාමක වාරයක් ද කියන්න මම දන්නේ නෑ

වාරේ කුරුඳු අරගෙන මම යන කලට

අලින් ගිය පාරක් ද කොටින් ගිය පාරක් ද මුවන් ගිය පාරක් ද ගෝනුන් ගිය පාරක් ද නයින් පොළඟුන් පිඹුරන් ගිය පාරක් ද මොන විදියේ පාරක් ද මම කියන්න දන්නේ නෑ

පාරේ වැරදිලා ගියේ කටුගස්තොටට

රත්තරන් මාලයක් ද රිදී මාලයක් ද තඹ මාලයක් ද පිත්තල මාලයක් ද මුතු මැණික් වෛරෝඩි බැඳපු මාලයක් ද මොන කෙහෙල්මල් මාලයක් ද කියන්න මම දන්නේ නැහැ

මාලේ බැඳපු අඟනක් එයි එගොඩ සිට

තාත්තගෙන් ආ නෑකමක් ද මුත්තගෙන් ආ නෑකමක් ද නත්තගෙන් ආ නෑකමක් ද පනත්තගෙන් ආ නෑකමක් ද කිත්තගෙන් කිරිකිත්තගෙන් කිරිකෑ මුත්තගෙන් ආ නෑකමක් ද කියන්න මම දන්නේ නෑ

හූරේ ඔරුව පැදපන් කීය මෙගොඩට

අයනු ආයනු ආ එම වසවතුගෙ මන රඟේ

ඉයනු ඊයනු ඉෂ්ට කර ගන්ට බුදු බව සිටිය රඟේ

උයනු ඌයනු උරුවෙල් දනවුවේ බෝසත් සිටිය රඟේ

එයනු ඒයනු අයිරාවණ ඇතු පිට නැගී එන රඟේ

තවද අයනු ආයනු කී හෙයින් ආව වසවර්ති මාරයා පරාජය කොට බෝ මුල වැඩ හිඳ බුදු වූ හෙයින්

අයනු ආයනු එම වසවතුගේ මන රඟේ

තවද ඉයනු ඊයනු කී හෙයින් ඉෂ්ට කර ගන්නා අදහසින් අප මහා බෝසතාණන් වහන්සේ උපනූපන් ජාතියෙහි සිල් රැක සිටි හෙයින්

ඉයනු ඊයනු ඉෂ්ට කර ගන්න බුදු බව සිටිය රඟේ

තව ද උයනු ඌයනු කී හෙයින් උරුවෙල් දනවුවේ සය අවුරුද්දක් දුෂ්කර ක්‍රියා කළ හෙයින්

උයනු ඌයනු උරුවෙල් දනවුවේ බෝසත් සිටිය රඟේ

තව ද එයනු ඒයනු කී හෙයින් නාලාගිරි හස්ති රාජයා රා සොළොස් කළයක් පොවා එවූ තැනේ දී එම ඇත් රාජයා මුනිඳු දැක දණ ඔබා සිටි හෙයින්

එයනු ඒයනු අයිරාවණ ඇතු පිට නැගී එන රඟේ

ළන්දකට වැදී හාවුන්ට ගෝනුන්ට මුවන්ට ඉත්තෑවුන්ට උරුලෑවුන්ට  අලින්ට කොටින්ට වලස්සුන්ට නයින්ට පොළඟුන්ට පිඹුරන්ට වෙඩි තියන්න යන්නා වාගේ

හෙමින් හෙමින් මම හේනට යන කලට

මහ උස් කණාටු පොල් ගසකින් පොල් ගෙඩි තුන්හාරදාහක් එකවර බිමට කඩා දැම්මා වාගේ

එකෙක් ඇවිත් ගැහුවා මගෙ පිට මැදට

නැන්දා මාමාගේ දූ වන ඇවැස්ස නෑනා කැන්දා ගෙන විත් හතර වරිගේ නෑයින් ඉදිරිපිට මඟුල් මේසේ කෑමක් කා ප්‍රීති වෙන්නා වාගේ

එගුටි කකා මම පිනමින් යන කලට

කොස් වාරේ හෙරළි කාලා ඇඟ පත දැඩි වූ ළමිස්සියන් විස්සක් තිහක් එකතුව කොක් හඬ  තළ තළා හිනා වන්නා වාගේ

මගෙ ම මට ම ඉල කැඩුණා හිනාවට

## අවබෝධය

1. **ඉහත දැක්වෙන තේරවිලිවලට ගැළපෙන පිළිතුරු වරහන් තුළ ඇති පද අතරින් තෝරන්න.** (ගිරය, දියහොල්මන, අන්නාසි, ඉරිඟු කරල්, ගොරකා, බිත්තරය, තිස්සමහාරාමය, දෙල්, කොණ්ඩ කැවුම)
2. **ගොවිකම හා සම්බන්ධ උපකරණයක් ගැන කියවෙන  තේරවිලි  කවිය දක්වන්න.**
3. **"කකා ගිය ලෙල්ල රස කර උයාලූ"  යන්නෙන් අදහස් කළේ කුමක් ද?**
4. **"මිතුරා" යන්නට යෙදෙන පද දෙකක් පාඩමෙන් උපුටා දක්වන්න.**
5. **ටීකා සීපද කීමෙන් ඉටු කර ගත්  අරමුණු කවරේ ද?**

## ප්‍රායෝගික අභ්‍යාස

1. පැන, කළුලැල්ල, විල්බැරෝව, වැස්ස, වලාකුළු යන පද පිළිතුරු වශයෙන් යෙදෙන පරිදි තේරවිලි කවි නිර්මාණය කරන්න.
2. ඒවා පාසල් බිත්ති පුවත්පතේ ප්‍රදර්ශනය කරන්න.
3. සිංහල සාහිත්‍ය සමිතියේ දී තේරවිලි කවි වටයක් සඳහා අවස්ථාව උදා කර ගන්න.
4. ඔබ කැමති මාතෘකාවක් යටතේ ටීකා සිවුපදයක් නිර්මාණය කරන්න.

# • සමානාර්ථ පද

කවර භාෂාවක වුව ද සමානාර්ථවත් පද දක්නට ලැබේ. පර්යාය පද ලෙස ද මේවා හැඳින්වේ. සමානාර්ථවත් පදවලින් ප්‍රකට වන්නේ එම භාෂාවේ ප්‍රකාශන ශක්තිය යි. භාෂා ඥානය දියුණු කර ගැනීමට සමානාර්ථවත් පද පිළිබඳ අවබෝධය ඉතා වැදගත් ය.

| | |
|---|---|
| අනවරත | නිරන්තර, නිතර, සතත |
| අරවින්ද | නෙලුම්, පියුම්, පද්ම, පංකජ, පඬෙරු, සියපත, සහස්පත, කමල් |
| අහස | ගුවන, නුබ, ආකාශය, සියොත්මග, සුරමග, සහතරුවැල |
| ඕලු | ඇඹුල, ශාලුක |
| උපුල | මානෙල්, ඉඳුවර, උත්පල |
| කුසුම් | මල්, පුෂ්ප, මිණිමුතු |
| කෝකිල | කොවුල්, පරපුටු, කොහා |
| කිරණ | රැස්, රශ්මිය, කර |
| ගුරු | ආචාර්ය, ඇදුරු, ශික්ෂක |
| තොල් | ලවන්, ඕෂ්ඨ, ඔට, අධර, අදර |
| නුවණ | නැණ, ඥානය, ප්‍රඥාව, පැණ |
| නුවන | ඇස්, අක්ෂි, නෙත්, නේත්‍ර, නයන |
| පොළොව | ධරණී, දෙරණ, මහී, මිහි, වසුන්ධරා |



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

| | |
|---|---|
| මව | අම්මා, මාතා, මාතෘ, ජනනී, දිනිති |
| මිතුරු | මිත්‍ර, සකි, සබඳ |
| වටාපත | තල්වැට, විජිනිපත |
| සතුරු | රුපු, පිළිමල්. ප්‍රතිමල්ලව, අරි, ශත්‍රු, පසමිතුරු |
| සයුර | සාගරය, සින්ධු, සිඳු, රත්නාකර, මුහුද, ජලනිධි, රුවනාර |
| ශ්වේත | සුදු, ධවල, ඇළි, හෙළ, සේ |
| හිරු | දිනකර, දිවයුරු, දිනපති, දිනමිණ, දිනිසුරු, රිවි, සූර්යයා, සහසකර, සැඩකර |

## අවබෝධය

1. **සමානාර්ථ පද ඇතුළත් පොත් පිංචක් පිළියෙල කරන්න.**
2. **පහත දැක්වෙන වාක්‍යවල ඉරි ඇඳි පද වෙනුවට උචිත සමානාර්ථ පද යොදා නැවත ලියන්න.**

උදාහරණය: රුක් මුදුන්හි සියොත් කැල නද දෙති.
තුරු සිරසෙහි කුරුලු රංචු හඬ නඟති.

i. අරුණෝදයේ පද්මයෝ පිබිදෙති.
ii. සැඳෑවේ පද්මයෝ පර වෙති.
iii. දද පෙළ පුරය සරසයි.
iv. අපි තුරුලිය සිටුවා මිහිලිය සරසමු.
v. ගුවන අරා පුරාහඳ දිලෙයි.
vi. සයුරු දිය මත සුදු පෙණ කැටි අලංකාර රටා මවයි.
vii. තාත්තා සෙනෙහසින් අප රැක ගත්තේ ය.
viii. අනුවණ දන දෙනුවන ලත් එල කිම?
ix. බඩගිනි වෙලා මා ගිය කල පුතුගෙ ගෙට
x. ශ්‍රී ලංකාව අසිරිමත් දිවයිනකි.

3. සමානාර්ථ පද ඇසුරු කර ගනිමින් ප්‍රහේලිකා සම්පූර්ණ කරන්න.

| | | | | |
|---|---|---|---|---|
| 1. | | 2. | | |
| | | | | |
| 3. | 4. | | | 5. |
| 6. | | | | |
| | 7. | | | |

**හරහට**

1. පිළිතුර
3. පංචතූර්ය
6. ලාක්ෂා
7. සාගරය

**පහළට**

1. මානෙල්
2. රැලි
4. රුපු
5. ලේ

| | | | | |
|---|---|---|---|---|
| 1. | | 2. | 3. | |
| | | 4. | | |
| 5. | 6. | | | 7. |
| 8. | | | 9. | |
| | 10. | | | |

**හරහට**

1. අඳුර
4. සුළඟ
5. දරුණු
8. තර්කය
9. සවන්
10. රජු

**පහළට**

1. අශ්වාරෝහකයා
2. වස්තු
3. වේලාව
6. දුර්ජන
7. පෙළ
9. කල්පය

4. පහත දැක්වෙන තේරවිලිවලින් කියවෙන තොරතුරු ඉන් අදහස් වන පිළිතුර සමග ගැළපෙන්නේ කවර ලක්ෂණ නිසා දැයි පන්තියට විස්තර කරන්න.

අත්තක් උඩ බුම්මා ගෙන
කටු රෙද්දක් පොරවා ගෙන
බඩේ පැටවු පුරවා ගෙන

(කොස් ගෙඩිය)

දාර දෙකයි එක නම මුල් කර තැනුවා
පාර තිහක් තැළුවට බයකුත් නැතිවා
කොන් සතරයි කණු සතරයි ගෙට ඇතුවා
තෝරාපන් ඊයේ මග දී දුටුවා

(ඉබ්බා)

වක්ක වකයි වක දෙවකයි
වත්තෙම පොල් ඔක්කොම කයි

**(හිරමණය)**

උඩිනුත් ගින්දර
යටිනුත් ගින්දර
මැද්දෙ සවුන්දර
කන්නෙ පාන්දර

**(ආප්ප)**

දික් දිගට කොළ ඇති
කන්නන්ට රස ඇති
දෙන්නන්ට අකමැති

**(උක්)**

උස් ගස්වල ලැග ඉන්නේ
බස බස ගා ඉගිළෙන්නේ
පැණි බී හප බිමට දමන්නේ
හැකි නම් මේ පද තෝරාපන්නේ

(වවුලා)

5. **ඔබ කැමති මාතෘකාවක් යටතේ ටීකා සිවුපදයක් නිර්මාණය කරන්න.**